#mediaethicsSL #SinhalaPress #Ika #SundayDivaina
යම් කිසි පුවතක් වාර්තා කිරීමේදී හෝ ලිපියක් සම්පාදනය කිරීමේදී, ඊට පාදක වන සිදුවීමට හෝ සිදුවීම් වලට අදාළ සියලුම පාර්ශවයන්ගේ අදහස් ලබාගැනීමට උත්සාහ කිරීම වඩාත් නිවැරදි ජනමාධ්‍යකරණය බව දැක්විය හැක. කෙසේ නමුත් එසේ සිදුවීමකට හෝ සිදුවීම් මාලාවකට සම්බන්ධ සියලුම පාර්ශවයන්ගෙන් විමසීම් සිදුකිරීමට හැකි සෑම සියලු උත්සාහයක්ම ගැනීම ඔස්සේ, ලිපියේ නිරවද්‍යතාවය ආරක්ෂා කිරීමට මෙන්ම පාඨකයාට තීරණ ගත හැකි සමබර ලිපියක් කියැවීමට ලබාදීමටද මාධ්‍යවේදීන්ට හැකි වනු ඇත.

මුහුදු මහා විහාරයට මුස්ලිම් අන්තවාදීන්ගෙන් අඩන්තේට්ටම් සිදුවන්නේය යන තේමාව ඔස්සේ ලියැවී ඇති දිවයින ප්‍රවෘත්තිය මෙහිදී උදාහරණයකට ගත හැක. මෙම ලිපියේ ඇති ඇතැම් කරුණු සනාථ කරගැනීම සඳහා මෙන්ම ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා, එහි චෝදනා එල්ල කෙරෙනා පාර්ශවයන් සම්බන්ධ කර ගැනීමට හැකියාවක් නොතිබුණිද? එසේ හැකියාවක් නොතිබුණේ නම් ඊට උත්සාහයක් ගත් බව හෝ ලිපියේ සඳහන් කළ යුතු නොවන්නේද? එසේ එම ලිපියේ අදාළ සිදුවීම් වලට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්ගේ අදහස්ද එකතු කරගැනීමට හැකි වූයේ නම්, ලිපිය වඩාත් සම්පූර්ණ නොවන්නේද?